# දැන්වීමයි

## <u>භාණ්ඩ අපහරණය සඳහා මිල ගණන් කැඳවීම</u>

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ 2024 වර්ෂයේ අපහරණය කරන ලද භාණ්ඩ විකිණීම සඳහා මුද්‍රා තැබූ මිල ගණන් **2026.05.19 දින මධ්‍යහ්න 12.00** ට පෙර **සාමාන්‍ය පාලන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය**. ප්‍රමාද වී ලැබෙන මිල ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පුද්ගලයින්** හට ඊට අදාළ අයදුම්පත් හා වැඩිදුර තොරතුරු සාමාන්‍ය පාලන අංශයෙන් ලබා ගත හැකිය. අදාළ භාණ්ඩ **2026.05.15 දින පෙ.ව. 11.00 සිට මධ්‍යහ්න 12.00** කාලය තුළදී පීඨ පරිශ්‍රයේ සේවක ආපන ශාලාව අසළ දී පරීක්ෂා කළ හැකිය.

භාණ්ඩ විකිණීම සම්බන්ධ අවසාන තීරණය ඊට අදාළව පත් කර ඇති කමිටුවේ තීරණය වන අතර ඔබ මිලදී ගත් භාණ්ඩ වල මුළු වටිනාකම **2026.05.26 වැනි දින ප.ව. 2.30ට පෙර** සරප් වෙත ගෙවා අදාළ රිසිට් පත සහකාර ලේඛකාධිකාරී - සාමාන්‍ය පාලන වෙත ඉදිරිපත් කර අදාළ දොරටු අවසරපත් ලබා ගැනීමෙන් අනතුරුව භාණ්ඩ එදිනම ඉවත් කර ගත යුතුය.

ලේඛකාධිකාරී
ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය
2026.05.12